**මිල්කෝ පුද්ගලික සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2023**

------------------------------------------------------------------------

මිල්කෝ පුද්ගලික සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්ව වල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කරන ලද මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 6.6 පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2022 හා 2023 වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා 2024 නොවැම්බර් 20 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ යම් ප්‍රමාදයක් ඇති බවට පිළිගන්නා අතර මේ වන විට 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර එම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අදාල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව විගණනය සඳහා ලබා දීමට නියමිතව ඇත. 2023 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මේ වන විට පිළියෙල කරමින් පවතී. | මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1. කර්මාන්තශාලාවල ලාභ අලාභ තත්ත්වය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම යටතේ පවතින කර්මාන්තශාලා 05 අතුරින් දිගන, අඹේවෙල, කොළඹ, පොළොන්නරුව කර්මාන්තශාලා 04 හි කිරි ආශ්‍රිත නිෂ්පාදන නිපදවන අතර පොල්ගහවෙල කර්මාන්තශාලාවේ සත්ත්ව ආහාර නිෂ්පාදනය කරනු ලබයි.කර්මාන්තශාලාවල ලාභ අලාභ තත්ත්වයන් පහත පරිදි වේ. | | |

| කර්මාන්තශාලාව | 2021 | 2022 | 2023 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| | | (කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන අනුව) | |
| ---------------- | ------ | ------ | ------- |
| අඹේවෙල | (84,540,671) | 344,160,692 | 405,754,087 |
| පොලොන්නරුව | 336,334,916 | (169,271,616) | 166,785,984 |
| දිගන | (55,533,416) | (514,941,217) | (69,804,663) |
| කොළඹ | 242,872,200 | (304,129,608) | 76,527,488 |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමට අයත් පොලොන්නරුව හා කොළඹ කිරි කර්මාන්තශාලාවන් හි 2021 වර්ෂයේ ලාභදායී තත්වයක් වාර්තා කර තිබුණු අතර 2022 වර්ෂයේදී කාර්මාන්තශාලා දෙකෙහිම සැලකිය යුතු අලාභදායී තත්ත්වයක් වාර්තා කර තිබුණි. 2023 වර්ෂයේදී නැවතත් ලාභදායී තත්ත්වයක් දක්වා වර්ධනය වී තිබුණද 2021 වර්ෂයට සාපේක්ෂව ලභාකරගෙන තිබූ ලාභදායිත්වය පිළිවෙලින් සියයට 50 කින් හා 68 කින් අඩුවී තිබුණි. | පොළොන්නරුව, දිගන සහ කොළඹ යන කර්මාන්තශාලාවල අලාභය 2021 සාපේක්ෂව විශාල ලෙස ඉහළ ගොස් ඇත. ඊට ප්‍රධාන හේතුව වන්නේ 2022 වර්ෂය තුල රට තුල පැවති ආර්ථික අවපාතය නිසා අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය සහ අනෙකුත් සේවා හා ද්‍රව්‍ය වල මිල ගණන් දෛනිකව ඉහල යාම නිසා නිෂ්පාදන පිරිවැය විශාල ලෙස ඉහල යාමත් මෙසේ ඉහල ගිය නිෂ්පාදන පිරිවැයට සාපේක්ෂව භාණ්ඩවල මිල ඉහල දැමීමට කටයුතු නොකිරීමයි. තවද ගොවීන්ගෙන් මිලදී ගන්නා ලද කිරි ලීටර ප්‍රමාණයෙහි අඛණ්ඩ අඩු වීමක් වාර්තා වූ බැවින් එය ආයතනයෙහි නිෂ්පාදන ධාරිතාවය අඩු | ආයතනයේ ලාභදායිත්වය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | වීමට බලපෑ අතර එය ආයතනයේ මෙම වසර වල ලාභදායිත්වය කෙරෙහි බලපාන ලදි. | |
| (ආ) | දිගන කිරි කර්මාන්තශාලාව 2021,2022 හා 2023 වර්ෂයන් වලදී අඛණ්ඩව අලාභදායී තත්ත්වයක් වාර්තා කර තිබුණු අතර එම තත්ත්වය ඇති වීමට බලපානු ලබන හේතු සොයා බලා කර්මාන්තශාලාව ලාභදායී තත්ත්වයට පත් කිරීමට කළමනාකාරිත්වය විසින් කටයුතු කර නොතිබුණි. | අමුද්‍රව්‍ය මිල ගණන් ඉහල යාම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහලයමත්. ඊට සාපේක්ෂව භාණ්ඩ මිල ගණන් ඉහල නොදැමීම සහ ගොවීන්ගේ කිරි නිෂ්පාදනය අඩුවීමත් මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. | මෙම කර්මාන්ත ශාලාවේ අලාභ ලැබීමට ප්‍රධාන වශයෙන් බලපාන කරුණු අධ්‍යයනය කර ලාභදායිත්වය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.2. අනුපාත විශ්ලේෂණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | සමාගම විසින් ඉදිරිපත් කර තිබූ 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ මූල්‍ය ප්‍රකාශන අනුව එම වර්ෂ 04 ට අදාළව ගණනය කළ ගිණුම්කරණ අනුපාත පහත දැක්වේ. | | |

| අනුපාතය | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|
| ----------- | ------ | ----- | ------ | ------ |
| ජංගම අනුපාතය | 1.35 | 1.091 | 1.52 | 1.99 |
| ක්ෂණික අනුපාතය | 0.67 | 0.62 | 0.79 | 0.89 |
| දල ලාභ අනුපාතය | 1.95% | 3.84% | 12.62 % | 9.48% |
| ශුද්ධ ලාභ අනුපාතය | (5.88)% | (8.36) % | 2.03% | 0.275 % |
| ණය ගැති එකතු කිරීමේ කාලය | දින 28 | දින 27 | දින 22 | දින 15 |

| | | | |
|---|---|---|---|
| (අ) | සමාගමේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය 2018 වසරේ සිට 2021 වර්ෂය දක්වා ඉහළ මට්ටමකට ගොස් තිබුණද ප්‍රශස්ත මට්ටමක නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව මණ්ඩලයේ කාරක ප්‍රාග්ධන ගැටලුවක් ඇති බව නිරීක්ෂණය වේ. | අදහස් දක්වා නොතිබුණි | ආයතනයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් ප්‍රශස්ථ ලෙස පවත්වා ගත යුතු වේ. |
| (ආ) | දල ලාභ අනුපාතය 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වර්ධනය වී තිබුණ ද 2021 වර්ෂයේදී සියයට 25 කින් අඩු වී තිබුණු අතර ශුද්ධ ලාභ අනුපාතය 2020 වසරේ සාධනීය තත්ත්වයක් පෙන්නුම් කළද 2021 වර්ෂයේදී නැවතත් සියයට 86 කින් පහත වැටී | නිෂ්පාදන පිරිවැය ඉහල යාම සහ ඊට සාපේක්ෂව භාණ්ඩ මිල ඉහල නොදැමීමත් හේතුවෙන් දල ලාභ අනුපාතය සහ | ආයතනයේ ලාභදායිත්වය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි.ඒ අනුව සමාගමේ ලාභ අලාභ තත්ත්වයත් නිරන්තරයෙන් විචලනය බව නිරීක්ෂණය විය. | ශුද්ධ ලාභ අනුපාතය අඩු වී ඇත. | |
| (ඇ) | ණයගැති එකතු කිරීමේ කාලයෙහි සැලකිය යුතු සාධනීය මට්ටමක් පෙන්නුම් කර තිබුණද වර්ෂ පහ ඉක්මවූ ශේෂ එකතු කර ගැනීම සම්බන්ධයෙන් මන්දගාමී තත්ත්වයක් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුනි. | හිඟ ණය අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සංයුක්ත සැලැස්ම පදනම් කරගෙන ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු අතර එයට, වාර්ෂික අයවැය ලේඛනය යෝජිත ප්‍රධාන ආයෝජන, ධාරිතා පුළුල් කිරීම්,ප්‍රධාන ප්‍රසම්පාදනයන් ඇතුළත් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, මානව සම්පත් සංවර්ධන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදී තොරතුරු ඇතුළත් කරමින් පිළියෙල කළ යුතු වුවද සමාගම විසින් 2023 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි ඉහත සඳහන් තොරතුරු ඇතුළත් නොවූ අතර ඉලක්ක ගත වැඩසටහන් පිළිබඳව පමණක් තොරතුරු ඇතුළත් කර තිබුණි. | 2023 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛනය සකස් කර තිබුණ ද එකී වාර්තා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛනය යනාදිය ඇතුලත් කර ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ යුතු වේ. |
| (ආ) | 2023 වර්ෂය තුළ සමාගම විසින් ඉටුකිරීමට සැලසුම් කර තිබූ කිරි භාරගැනීමේ කටයුතු ඩිජිටල්කරණය කිරීම, දිගන කර්මාන්තශාලාවේ ශීතාගාරයක් ඉදිකිරීම, අඹේවෙල කර්මාන්තශාලාවේ අපජල පවිත්‍රාගාරයේ දෙවන අදියර සඳහා මූලික කටයුතු සිදු කිරීම, පොළොන්නරුව කර්මාන්තශාලාවේ යන්ත්‍රාගාර ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම යන කාර්යයන් හි භෞතික ප්‍රගතිය අපේක්ෂිත ආකාරයෙන් ළඟාකර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි. | අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර ගැනීමේ අපහසුතාවයත්, වර්ෂ මැදදී ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට අමාත්‍ය මණ්ඩල විසින් ගත් තීරණයත් හේතුවෙන්, ප්‍රාග්ධන වියදම් ඇතුළත් එම ව්‍යාපෘතිවල අපේක්ෂිත භෞතික ඉලක්ක ළඟා කර ගැනිමට නොහැකි විය. | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටුකිරීමට අවධානය යොමු විය යුතු වේ. |
| (ඇ) | 2023 වර්ෂය තුල නිම කිරිමට අපේක්ෂිත වැඩසටහන් 19 ක් සැලසුම් කර තිබුණු අතර ඉන් වැඩසටහන් 07කම භෞතික ප්‍රගතිය ළඟාකරගැනීම සියයට 50 කට අඩු මට්ටමක පැවතුණු අතර සමාගමට අයත් ගොවිපලවල් ආරම්භ කිරීම, අඹේවෙල කර්මාන්තශාලාවේ | වර්ෂය තුළ පැවති මූල්‍ය දුෂ්කරතා, කළමණාකාරිත්වය විටින් විට ගත් තීරණ හා ප්‍රමුඛත්වය ලබාදුන් අනුපිළිවෙල අනුව සැලසුම් කර තිබූ සමහර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටුකිරීමට අවධානය යොමු විය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | පැරණි බටර් කර්මාන්තශාලාවේ පොළොව ප්‍රතිසංස්කරණය කිරීම, ඵලදායී අලෙවිකරණ සැලැස්මක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන කාර්යයන්හි භෞතික ප්‍රගතිය ළඟාකර ගැනීම සියයට 10 ක් වූ අතර සැලසුම්කර තිබුණු ඉන්වොයිස් හා විකුණුම් බෙදාහැරීමේ පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීමේ කාර්යයෙහි භෞතික ප්‍රගතිය ළඟාකර ගැනීම සියයට 5 ක් විය. | අපහසු විය. | |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1.(ආ) ඡේදය අනුව සමාගම විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඉන්පසු එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 දක්වා ඇති කරුණු ද ඇතුළත්ව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කරන ලද ප්‍රසම්පාදන සැලැස්මක් මණ්ඩලය විසින් පිළියෙල කල යුතු වුවද එවැනි කරුණු ඇතුළත්ව ප්‍රසම්පාදන සැලැස්මක් 2023 වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි. | ඉදිරි වර්ෂ සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 4.2. මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමු කිරි එකතුකිරීමේ ප්‍රාදේශීය ව්‍යාප්තිය අනුව 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී නුවරඑළිය කලාපය හැර අනෙක් කලාප 9 හි අමු කිරි එකතු කිරීම ලීටර් 7,831,666 ක අඩු වීමක් නිරීක්ෂණය වූ අතර 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ සියළුම ප්‍රාදේශීය කලාප වල අමු කිරි එකතුකිරීම ලීටර් 20,408,863 කින් අඩු වී තිබුණි. | 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂය තුළ කිරි අඩුවීම සඳහා තරගකාරී කිරි එකතුකරන්නන් කිරි කර්මාන්තයට එකතුවීමත්, ඔවුන් විසින් කිරිවල ගුණාත්මක තත්ත්වය නොසලකා කිරි මිලදී ගැනීමත් හේතුවිය. එමෙන්ම, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය තුළ කිරි අඩුවීම සඳහා අනෙකුත් තරගකරුවන්ට සාපේක්ෂව, නිවැරදි කාලසීමාවේ දී මිල්කො ආයතනය විසින් කිරි මිල වැඩි කිරීමට අපොහොසත් වීම මූලිකවම හේතුවිය. | නිෂ්පාදනයට අවශ්‍ය අමු කිරි මිලදී ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ආ) | සමාගමේ 2021,2022 හා 2023 යන වර්ෂවල නිෂ්පාදනයන්ගේ ප්‍රගතිය අනුව 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වසරේ පාස්චරිත කිරි, මීකිරි හා චීස් | නිෂ්පාදන සඳහා මූලික අමුද්‍රව්‍ය වන අමු කිරි එකතු කිරීම අඩුවීමට සාපේක්ෂව | නිෂ්පාදනය වර්ධනය කර ගැනීමට අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | හැර අනෙකුත් නිෂ්පාදනයන් හි අඩුවීමක් නිරීක්ෂණය වූ අතර 2022 වසරට සාපේක්ෂව 2023 වර්ෂයේ දී දියර කිරි, යෝගට්,එළඟි තෙල් යන නිෂ්පාදනයන් අඩු වී තිබුණි. | නිෂ්පාදනය ද අඩුවිය. | ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සමාගමේ 2021,2022 හා 2023 යන වර්ෂවල විකුණුම් ප්‍රගතිය අනුව 2021වර්ෂයට සාපේක්ෂ ව 2022 වසරේ UHT කිරි, ස්ටීරියලයිස්ඩ් කිරි, යෝගට්,අයිස් ක්‍රීම්,එළඟි තෙල්, චීස්, බටර්, කිරිපිටි හා උකු කිරි විකුණුම් හි අඩුවීමක් නිරීක්ෂණය වූ අතර 2022 වසරට සාපේක්ෂව 2023 වර්ෂයේ දී මී කිරි,අයිස් ක්‍රීම්, චීස් හා කිරිපිටි හැර අනෙකුත් නිෂ්පාදනයන්වල විකුණුම් සීඝ්‍ර ලෙස අඩු වී තිබුණි. | නිෂ්පාදනයට සාපේක්ෂව විකුණුම් ප්‍රමාණයන් ද අඩුවිය. | නිෂ්පාදනය සහ විකුණුම් වර්ධනය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඈ) | අපේක්ෂිත වෙළදපොල කොටස ළගාකර ගැනීම සඳහා අපේක්ෂිත නිමවුම නිෂ්පාදනය කිරීමට අවශ්‍ය ප්‍රධාන යෙදවුම වන කිරි ප්‍රමාණය රටෙහි සමස්ථ කිරි නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් මිලදී ගැනීම සිදු කළ යුතු අත්‍යාවශ්‍ය කරුණක් වුවද සමාගම විසින් සිය නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය කිරි මිලදී ගැනීම 2021,2022 හා 2023 වර්ෂ තුලදී සියයට 9ක් 13ක් හා සියයට 8ක් තරම් වූ අවම මට්ටමක පැවතුණි. | අදහස් දක්වා නොමැත. | නිෂ්පාදනයට අවශ්‍ය අමු කිරි මිලදී ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. |

| | 2021 | 2022 | 2023 |
|---|---|---|---|
| | -------- | --------- | ------- |
| අපේක්ෂිත දියර කිරි ප්‍රමාණය (ලීටර්) | 96,551,000 | 66,629,000 | 59,342,000 |
| සමාගම විසින් දියර කිරි එකතු කිරීම (ලීටර්) | 67,905,259 | 47,496,397 | 39,775,076 |
| ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනුව සමස්ථ දියර කිරි නිෂ්පාදනය (ලීටර්) | 513,305,478 | 506,449,602 | 504,153,360 |
| එකතු කිරීම් ප්‍රගතිය සමස්ථ දියර කිරි නිෂ්පාදනය% ලෙස | 13.22 | 9.38 | 7.9 |

| | | | |
|---|---|---|---|
| i. | සමාගම විසින් එකතු කරන දියර කිරි ප්‍රමාණය 2021 වසරේ සිට 2023 වර්ෂය දක්වා ක්‍රමයෙන් අඩු වී තිබුණු අතර 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී එම අඩු වීම ලීටර් 7,721,321ක් හෙවත් සියයට 16.2ක් විය. | 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂය තුළ කිරි අඩුවීම සඳහා තරගකාරී කිරි එකතුකරන්නන් කිරි කර්මාන්තයට එකතුවීමත්, ඔවුන් විසින් කිරිවල ගුණාත්මක තත්ත්වය නොසලකා කිරි මිලදී ගැනීමත් | නිෂ්පාදනයට අවශ්‍ය අමු කිරි මිලදී ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | හේතුවිය. එමෙන්ම, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය තුළ කිරි අඩුවීම සඳහා අනෙකුත් තරගකරුවන්ට සාපේක්ෂව, නිවැරදි කාලසීමාවේ දී මිල්කෝ ආයතනය විසින් කිරි මිල වැඩි කිරීමට අපොහොසත් වීම මූලිකවම හේතුවිය. | |
| | ii. දිවයිනේ සමස්ථ දියර කිරි නිෂ්පාදනය සමාගම විසින් එකතු කරන දියර කිරි ප්‍රමාණයේ ප්‍රතිශතයට ඉතා අවම මට්ටමක පවතින අතර එම ප්‍රතිශතය 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ක්‍රමයෙන් අඩුවී තිබුණි.2022 වර්ෂයේ එම ප්‍රතිශතය සියයට 9.38ක් වූ අතර 2023 වර්ෂයේදී එය සියයට 7.9 දක්වා අඩු වී තිබුණි. | 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය තුළකිරි අඩුවීම සඳහා අනෙකුත් තරගකරුවන්ට සාපේක්ෂව, නිවැරදි කාලසීමාවේ දී මිල්කෝ ආයතනය විසින් කිරි මිල වැඩි කිරීමට අපොහොසත් වීම මූලිකවම හේතුවිය. | නිෂ්පාදනයට අවශ්‍ය අමු කිරි මිලදී ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ඉ) | 2021 වසරේදී සත්‍ය දියර කිරි විකුණුම් ප්‍රමාණය ලීටර් 20,705,024ක් හා 2022 වර්ෂයේදී දියර කිරි විකුණුම් ප්‍රමාණය ලීටර් 16,012,534ක් වූ අතර 2023 වර්ෂයේ දී දියර කිරි විකුණුම් ප්‍රමාණය ලීටර් 13,258,335ක් වූයෙන් ක්‍රමයෙන් දියර කිරි විකුණුම් අඩුවී තිබුණි. වර්තමාන වෙළෙඳපොළ ප්‍රවණතාවය දියර කිරි පරිභෝජනය වුවත් ඒ පිළිබඳ කළමනාකරණය අවධානය යොමුකර දියර කිරි නිෂ්පාදනය වැඩිකර ගැනීම සඳහා යොමුවී නොතිබුණි. | සමස්ථ කිරි නිෂ්පාදනය අඩුවීමට සාපේක්ෂව දියර කිරි නිෂ්පාදනය ද අඩුවිය. | විකුණුම් වර්ධනය කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ඊ) | බඩල්ගම කිරි සැකසුම් කර්මාන්ත ශාලාව ස්ථාපිත කිරිම සඳහා රු,9.718,217,432 (යුරෝ 63.,935,641) ක කොන්ත්‍රාත් වටිනාකමකට 2015 වර්ෂයේ විදේශ කොන්ත්‍රාත් සමාගමක් සමග ගිවිසුම්ගත වී තිබුණු අතර එය 2019 වර්ෂයේ දී අවසන් කිරීමට නියමිත විය.එසේ වුවද අදාල කාල සීමාව තුල ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි වීම හේතුවෙන් වර්තමානය වන විට කර්මාන්ත ශාලාවේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද කර්මාන්ත ශාලාවේ විදුලි සැපයුම ලබා ගැනීම සඳහා ඉදිකර තිබූ ට්‍රාන්ස්පෝමරය දෛනිකව පැය 24 පුරාවටම ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වා ගත යුතු බැවින්, නිෂ්පාදන කටයුතු සිදු නොවුණද කර්මාන්ත ශාලාව විසින් මාසිකව සැලකිය යුතු පිරිවැයක් විදුලි වියදම් වෙනුවෙන් වැය කර තිබුණු අතර ඉදිකිරීම් නවතා දමා තිබුණු කාල සීමාව වන 2022 පෙබරවාරි සිට 2024 ජූනි මාසය දක්වා එකතුව රු.12,079,005 ක විදුලි වියදමක් දරා තිබුණි. එය කර්මාන්තශාලාවේ මාසික විදුලි වියදමින් 2/3 ක් පමණ විය. එසේම මෙහි ආරක්ෂක කටයුතු වෙනුවෙන් ද ආසන්න වශයෙන් | මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සිදු කිරීමට 3phase විදුලිය ලබා ගැනීම ට්‍රාන්ස්පෝමරයක් හරහා සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සිදුවන කාලවකවානුව තුල මෙහි සම්පූර්ණ විදුලි බිල්පත් ගෙවීම් සිදු කරනු ලැබුයේ ඩෙස්මි කන්ස්ට්‍රක්ෂන් ඒ/එස් සමාගම මගිනි. දැනට මෙම ව්‍යාපෘතිය නතර වී තිබුනත් අපගේ ඉන්ජිනේරුවන් මෙම ව්‍යාපෘතියේ නිල නිවාස සහ ගොඩනැගිලි භාවිතයට ගනු ලබන බැවින්, එයට අදාල විදුලි බිල්පත් අප ආයතනය විසින් ගෙවීම් සිදු කරනු ලබයි. මෙහි ඇති යන්ත්‍ර සූත්‍ර සහ ගොඩනැලි වල ආරක්ෂාව පිළිබඳ | ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කර නිෂ්පාදනය ආරම්භ කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශව අවධානය යොමු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | මාසිකව රු. 200,000 කට අධික පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.මෙහෙයුම් කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය නොකිරීම හේතුවෙන් එම වැය කරන ලද ආරක්ෂණ හා විදුලි වියදම් අනාර්ථික වියදමක් වී තිබුණි. | අවධානය යොමු කර පෞද්ගලික ආරක්ෂණ ආයතනයකින් මෙම ව්‍යාපෘතියේ ආරක්ෂක කටයුතු සඳහා සේවාවක් ලබා ගෙන ඇත. ආරක්ෂක වියදම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන විටත් අප විසින් දරනු ලැබූ අතර මෙය ව්‍යාපෘති කටයුතු ඉදිරියට සිදුවන තෙක් මෙම වියදම දැරීමට සිදු වන ඇත. | |
| (ඇ) | බඩල්ගම නව කිරි කර්මාන්තශාලාවේ ඉදිකිරීම් වලින් පරිපාලන හා කාර්යාල ගොඩනැගිල්ල 2021 මාර්තු 24 දිනත්, කර්මාන්තශාලා සාමාන්‍යාධිකාරිතුමාගේ නිල නිවස හා ජ්‍යෙෂ්ඨ නිල නිවාස 04 ක් 2021 දෙසැම්බර් 15 දිනත්, කනිෂ්ඨ නිල නිවාස 05 ක් 2020 ජනවාරි 22 දිනත්, මිල්කෝ ආයතනය වෙත භාර දී තිබූ නමුත් කර්මාන්ත ශාලාවේ ඉදිකිරීම් කටයුතු 2023 වර්ෂයේ ජුනි මස වන විට අතරමග නවතා දමා තිබුණි. 2023 ජුනි මස සිට 2023 ඔක්තෝම්බර් මාසය දක්වා පිරිසිදු කිරීමේ කටයුතු වෙනුවෙන් කම්කරුවන් දෙදෙනෙකු හෝ තුන්දෙනෙකු යොදවා තිබුණ ද කර්මාන්ත ශාලාවේ භෞතික පරීක්ෂාවේ දිනය වූ 2024 ජූලි 04 දින දක්වාම කිසිදු සේවකයෙකු පිරිසිදු කිරීමේ කටයුතු වෙනුවෙන් යොමුකර නොතිබුණි. භෞතික පරීක්ෂණ දිනය වන විට පරිපාලන හා කාර්යාල ගොඩනැගිල්ල හැර අනෙකුත් සියළුම නිවාස වල තත්ත්වය නිසි පරිදි නඩත්තු කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ඒවායේ අභ්‍යන්තරයේ පවා වල් පැලැටි හා වැල් ශාක පැලවී විවිධ කෘමි සතුන්ගේ හා මීයන් වැනි සතුන්ගේ වාසස්ථාන බවට පත් වී තිබුණු බවත් ඇතැම් නිවාස වල ඇති ගෘහ භාණ්ඩ වලට හානි වී තිබූ බවත් නිරීක්ෂණය විය. | බඩල්ගම කිරි කර්මාන්තශාලා ව්‍යාපෘතිය “TURNKEY” ක්‍රමවේදය යටතේ සිදු කරනු ලබන ව්‍යාපෘතියක් වන අතර මෙම ක්‍රමවේදය යටතේ සිදු කරනු ලබන ව්‍යාපෘතීන් සම්පූර්ණ ව්‍යාපෘතිය අවසන් කර අදාල හිමිකරුවන් වෙත පවරන තෙක් ව්‍යාපෘතියේ කටයුතු පාලනය වනුයේ එය ඉදිකිරීමට අවසර ලත් සමාගමට වේ.ඒ අනුව මෙම ව්‍යාපෘතියේ සම්පූර්ණ කටයුතු සිදු කරනු ලබන්නේ ඩෙස්මි කන්ස්ට්‍රක්ෂන් ඒ/එස් සමාගම මගිනි. 2022.04.12 දින ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව අප රට බංකොලොත් රාජ්‍යක් ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමග විදේශීය ණය ගෙවීම් නතර කිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු තාවකාලිකව නතර කරනු ලැබ ඇත. අප විසින් මෙම තත්ත්වය සම්බන්ධයෙන් වර්ථමාන රජයද දැනුවත් කරන ලද අතර මේ සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳ නිල තීරණයක් අප වෙත දැනුවත් කරනොමැත. මේ හේතුවෙන් ඉදිකිරීම් කර ඇති ගොඩනැගිලි වල පිරිසිදු කිරීම් මෙන්ම අනෙකුත් කටයුතුද මේ වන විට සිදු නොවේ. නමුත් අප විසින් දෛනික පදනම මත මුදල් ගෙවා මෙම ගොඩනැගිලි | ඉදිකිරීම් කටයුතු නිම කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශව අවධානය යොමු කළ යුතු අතර ඉදිකර ඇති ගොඩනැගිල නඩත්තු කර විධිමත්ව පවත්වාගෙන යාම කෙරෙහිද අවධානය යොමු විය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | සහ නිවාස පිරිසිදු කිරීම් කටයුතු විටින් විට සිදු කරනු ලැබ ඇත. මෙම කටයුතු ඉදිරියේදිත් සිදු කරන බව සදහන් කල යුතු වේ. | |
| (ඌ) | බඩල්ගම කිරි සැකසුම් කර්මාන්ත ශාලාව තුල ඇතුළත්ව තිබුණු කිරි නිෂ්පාදන ගොඩනැගිල්ලේ ප්‍රධාන විදුලි පරිපථයට සම්බන්ධ කර ඇති **UPS** පද්ධතිය සම්පූර්ණ කර 2024 වර්ෂය වන විට වර්ෂ 04 කට අධික කාලයක් ගතවී තිබුණි. එම පද්ධතිය තුල විදුලිය ලබා ගැනීම සඳහා බැටරි 100 කට අධික ප්‍රමාණයක් ඇතුලත් කර තිබුණු අතර විගණන දින වන 2024 ජූලි 01 දින වන විට එම බැටරිවල ආයුකාලය අවසන් වී තිබුණු හෙයින් කර්මාන්ත ශාලාවේ වැඩකටයුතු ආරම්භ කිරීමට ප්‍රථම නැවත එම බැටරි ප්‍රතිෂ්ඨාපනය කළ යුතු අතර ඒ සඳහා එක් බැටරියක් වෙනුවෙන් රු. 60,000 කට අධික පිරිවැයක් දැරීමට සිදුවන බවත් ඒ අනුව මේ සඳහා ආසන්න වශයෙන් රු. 6,000,000 ක පිරිවැයක් දැරීමට සිදු වන බවත් නිරීක්ෂණය විය. | කිරි කර්මාන්තශාලා ගොඩනැගිල්ලේ ප්‍රධාන විදුලි පරිපථ පද්තියට අදාල UPS පද්ධතියේ බැටරි මේ වන විට සවිකර වසර 4 කට ආසන්න වේ. එහි විදුලි ආරෝපන ශක්තිය මේ වන විට අඩු වීමට ඇති හැකියාවක් තිබුනද, මෙම ව්‍යාපෘති වැඩ කටයුතු ආරම්භ වන අවස්ථාවේදී UPS පද්ධතියේ බැටරි අලුතින් සවිකිරීමට අවස්ථාවක් ඇති වුවහොත් එම තත්ත්වය අනුව මිල්කො ආයතනය සහ ඩෙස්මි කන්ස්ට්‍රක්ෂන් සමගම සමග කටයුතු කරනු ඇත. | ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කිරීම තුලින් දැරීමට සිදුවන අතිරේක පිරිවැයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (එ) | කර්මාන්ත ශාලාව තුල ස්ථාපනය කර තිබුණු විදුලි ජනක යන්ත්‍ර 02 හි ඇති බැටරිවලද ආයුකාලය අවසන් වී තිබුණි. ඒ හේතුවෙන් කර්මාන්ත ශාලාවේ වැඩකටයුතු ආරම්භ කිරීමට ප්‍රථම නැවත එම බැටරිද ප්‍රතිෂ්ඨාපනය කළ යුතු බවත් ඒ සඳහා එක් බැටරියක් වෙනුවෙන් රු. 100,000 කට අධික පිරිවැයක් දැරීමට සිදුවන බවත් ඒ අනුව ආසන්න වශයෙන් රු. 400,000 කට අධික පිරිවැයක් දැරීමට සිදුවන බවත් නිරීක්ෂණය විය. | බඩල්ගම කර්මාන්තශාලාවේ ස්ථාපිත කර ඇති විදුලි ජනක යන්ත්‍ර දෙකෙහි ඇති ආරෝපන බැටරි මේ වන විට ආයුකාලය අවසන් වී තිබුණද, මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු ආරම්භ කර පසු අවශ්‍යතාවය මත මෙම නවබැටරි සවිකිරිම එම තත්ත්වය අනුව මිල්කො ආයතනය සහ ඩෙස්මි කන්ස්ට්‍රක්ෂන් සමගම සමග කටයුතු කරනු ඇත. | ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කිරීම තුලින් දැරීමට සිදුවන අතිරේක පිරිවැයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1980 මාර්තු 10 දින මැනුම් කරන ලද පිඹුරු අංක:4754 අනුව අඹේවෙල කර්මාන්තශාලාව ස්ථාපිතව ඇති රජයට අයිති ඉඩම අක්කර 40 රූඩ් 01 පර්චස් 36 ක් වන අතර එහි සමාගම විසින් රු. මිලියන 5,548 ක් වටිනා ඉදිකිරීම් හා සවිකිරීම් කර ඇති නමුත් මෙම ඉඩමේ අයිතිය 2023දෙසැම්බර් 31 දක්වාම සමාගමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සඳහා බදු අයිතියක් ලබාදී ඇති නමුත්, බදු ගිවිසුම් අත්සන් කර නොමැත. ඉඩමේ අයිතිය පවරා ගැනීමට අදාළ ඉල්ලීම් අමාත්‍යාංශය මඟින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමුකර ඇති අතර, ඔවුන් විසින් මෙම කටයුතු සිදුකළ යුතුව ඇත. එසේම, මිල්කො ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන ඇති බැවින්, එම | ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | ඉඩමේ අයිතිය පවරාගැනීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදී. | |
| (ආ) | පොළොන්නරුව කිරි කර්මාන්තශාලාව පිහිටි අක්කර 12ක ඉඩම හා තවත් අක්කර 37ක් ලෙස ඉඩම් 2ක් සමාගම සතුව පවතී. නමුත් 2023 වර්ෂය අවසන් වන විටත් මෙම ඉඩම් දෙකට අදාළ ඔප්පු හා පිඹුරුපත් සමාගම සතුව නොතිබුණි. | මෙය රජය සතු ඉඩමකි. මෙහි භුක්තිය පමණක් මිල්කො ආයතනයට පවරා ඇත. මෙම ඉඩම් වල සම්පූර්ණ අයිතිය මිල්කො ආයතනයට පැවරිය යුත්තේ රජය විසිනි. මෙම ඉඩම්වල පිඹුරුපත් මේ වන විට සොයාගෙන ආයතනය සතුව ඇත. | ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමාගමට අයත් අඹේවෙල, දිගන, පොළොන්නරුව යන කර්මාන්තශාලාවන්හි වසර 05 ඉක්ම වූ මුළු ණයගැති ශේෂය රු.9,313,290 ක් වූ අතර මෙම ණය ශේෂ අයකරගැනීම අවිනිශ්චිත තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය. | මෙම ශේෂ තුල දීර්ඝ කාලීනව නොවෙනස්ව පවත්නා ශේෂ ( Non-Moving) ඇතුලත් වන අතර එම ශේෂ ගිණුම්වලින් ඉවත් කිරීමට අදාල අනුමැතීන් ලබා ගැනීමේ ක්‍රියාවලිය මේ වනවිට සිදු කරමින් පවතී. | හිඟ ණය අය කර ගැනීමට හෝ අයකර ගත නොහැකි නම් අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ ප්‍රධාන කාර්යාලයේ වසර 05 ඉක්ම වූ ගෙවිය යුතු ණයහිමි ශේෂ වටිනාකම රු.11,198,640ක් වූ අතර ඒ තුළ රු.4,141,873ක් වූ හර ශේෂ ද පැවතුණි.තවද අඹේවෙල කර්මාන්තශාලාවේ රු.4,591,120ට ක් වූ ගෙවිය යුතු ණයහිමි ශේෂයට අදාළව කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ශේෂ තුල දීර්ඝ කාලීනව නොවෙනස්ව පවත්නා ශේෂ ( Non-Moving) ඇතුලත් වන අතර එම ශේෂ ගිණුම්වලින් ඉවත් කිරීමට අදාල අනුමැතීන් ලබා ගැනීමේ ක්‍රියාවලිය මේ වනවිට සිදු කරමින් පවතී. අදාල නිවැරදි කිරීම් මගින් මෙම ගිණුම්කරණ දෝෂ ඉදිරි වසර වලදී නිවැරදි වනු ඇත. | ගෙවියයුතු මුදල් ගෙවීමට හෝ එසේ නොමැති නම් අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඊ) | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2023 වර්ෂය සඳහා 2024 නොවැම්බර් 24 දිනට භෞතික සත්‍යාපනයක් කර නොතිබූ අතර, නිසි පරිදි පරිදි නඩත්තු කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් ද සමාගම විසින් පවත්වා නොගන්නා බැවින් ස්ථාවර වත්කම් වල පිරිවැය, පැවැත්ම, ක්ෂය ගණනය කිරීම් ඉවත් කරන ලද වත්කම් වල පිරිවැය ආදියෙහි නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය . | වත්කම් භෞතික සත්‍යාපනයකට අනුව ප්‍රත්‍යාගණනයකට අවශ්‍ය සැලසුම් සිදු කරමින් පවතී. | ස්ථාවර වත්කම් වලට අදාලව විධිමත් ලේඛණයක් පවත්වාගෙන යා යුතු අතර ඒවා නිවැරදිව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාගමට අයත් දිගන කිරි කර්මාන්තශාලාවේ පවතින රු.9,500,000 ක් පිරිවැය වූ ස්ටිරියලයිස්ඩ් කිරි බෝතල් නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය හා කොළඹකිරි කර්මාන්තශාලාවේ රු.15,445,587ක් වූ අයිස් ක්‍රීම් බඳුන් නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය පිළිවෙලින් සියයට 46 හා සියයට 71 ක් යනාදී වශයෙන් අවම මට්ටමක ඌන උපයෝජිත තත්ත්වයෙන් පැවතුණි. | සමස්ථ කිරි නිෂ්පාදනය අඩුවීමටසාපේක්ෂව ජීවානුහරිත කිරි (Sterilize Milk) බෝතල් නිෂ්පාදනය ද අඩුවිය. එසේම, රටෙහි පැවති උද්ධමනය හේතුවෙන් අයිස් ක්‍රීම් සඳහා තිබූ ඉල්ලුම අඩු වූ අතර, ඊට සාපේක්ෂව අයිස් ක්‍රීම් නිෂ්පාදනය සීමා කිරීමට සිදුවිය. | නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය කිරීමට අදාල ක්‍රියාමාර්ග ගත යුතු අතර ඒ අනුව නිෂ්පාදනය වර්ධනය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඌ) | අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ පැරණි සහ නව නිෂ්පාදනගාරයන්හි සමස්ත ධාරිතාවය ලීටර් 9,300,000 ක් වුවද 2021,2022 හා 2023 වර්ෂවල විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සාමාන්‍ය ධාරිතා උපයෝජනය පිළිවෙලින් ලීටර් 2,675,819ක් , ලීටර් 1,497,295ක් හා ලීටර් 1,092,820 ක් වූ අතර එය මුළු ධාරිතාවයෙන් පිළිවෙලින් සියයට 29ක් ,16 ක් හා සියයට 12 ක් තරම් වූ පහළ මට්ටමක පැවතුණි. | අමු කිරි එකතු කිරීම අඩුවීමට සාපේක්ෂව නිෂ්පාදනය ද අඩුවිය. | අමු කිරි එකතු කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු අතර නිෂ්පාදනය වර්ධනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

**4.4. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | 2023 වර්ෂය සඳහා සමාගමේ අනුමත කාර්යය මණ්ඩලය 1578ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්යය මණ්ඩලය 1242 විය.විස්තර පහත පරිදි වේ. | | |

| | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ** | 80 | 63 | 17 |
| **තෘතියික** | 133 | 118 | 15 |
| **ද්විතියික** | 529 | 394 | 135 |
| **ප්‍රාථමික** | 836 | 667 | 169 |
| | 1578 | 1242 | 336 |

| | | | |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂය සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 80 ක් පැවති අතර තත්‍ය නිලධාරීන් ගණන 63ක් වූයෙන් තනතුරු 17ක් පුරප්පාඩුව පැවතුණි.එම තනතුරු අතුරින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හා | රජය මගින් සේවක බඳවා ගැනීම් සම්බන්ධයෙන් සීමාවන් පැණවීම හා පසුව මිල්කො සමාගම | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය.. |

| | | | |
|---|---|---|---|
| | සැලසුම් හා මෙහෙයුම් කළමනාකරු, පර්යේෂණ හා සංවර්ධන සහකාර කළමනාකරු යන තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.තවද ව්‍යාපෘති හා ඉංජිනේරු කළමනාකරු යන තනතුර සඳහා අනුමත නිලධාරීන් ගණන 01 ක් වුවද ඒ සඳහා ස්ථිර පදනම මත නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගෙන තිබුණි. | ප්‍රතිව්‍යුහගත කිරීමට අදාලව අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් අනුව සේවක බඳවා අත්හිටුවීමට කටයුතු කර ඇත. ඒ හේතුවෙන් අනුමත තනතුරු වෙනුවෙන් රාජකාරී ඉටුකිරීමට නිලධාරීන් පත්කර ඇත. තවද අභ්‍යන්තර සේවා අවශ්‍යතාවය මත නව නිපැයුම් හා සංවර්ධන අංශයට කළමනාකාරවරයෙක් බඳවාගෙන ඇති අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර නොතිබීම හේතුවෙන් අනුමත තනතුරක් වන සහකාර කළමනාකාර - ව්‍යාපෘති හා ඉන්ජිනේරු යන තනතුරට ඇතුළත් කර ඇත. | |
| (ආ) | සමාගමේ තෘතියික මට්ටමේ තනතුරු 04 වන ඉංජිනේරු, කිරි සංවර්ධන සහ මිලදී ගැනීම් නිලධාරී, සැලසුම් හා මෙහෙයවීම් නිලධාරී සහ තත්ත්ව සහතික කිරිමේ නිලධාරී යන තනතුරු සඳහා අනුමත සේවක සංඛ්‍යාව පිළිවෙලින් 07ක්, 02ක්, 10ක් හා 01 ක් වුවද තත්‍ය සේවක සංඛ්‍යාව 10ක්, 03ක් ,12 ක් හා 02 ක් වූයෙන් එම තනතුරු වල සේවකයින් 03ක්, 01ක්, 02 ක් හා 01 ක් වශයෙන් අතිරික්තව සේවයේ නිරතව සිටින බවනිරීක්ෂණය වූ අතර එම තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවා අවශ්‍යතාවය මතසහ නිලධාරින් කෙටි කාල සීමාවක් තුල ඉල්ලාඅස්වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වූ බැවිනි අතිරික්ත කාර්ය මණ්ඩලයක් බඳවාගෙන ඇති බවත් මේවන විට අතිරික්ත සේවකයන් වෙනත් ඵලදායී කාර්යයන්වල යොදවා ඇති බව | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් සේවක බඳවා ගැනීම් වලට අදාල අවශ්‍ය අනුමැතීන් විධිමත්ව ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමාගමේ අනුමත කාර්ය මණ්ඩලයේ සිටින තෘතියික මට්ටමේ තනතුරු 02 ක් වන තොරතුරු තාක්ෂණ නිලධාරී හා ප්‍රමාණ මිනින්දෝරු යන තනතුරු හා ප්‍රාථමික මට්ටමේ මෝටර් විදුලි කාර්මික තනතුර සඳහා 2023 දෙසැම්බර් 31 දිනට බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. තවද ප්‍රාථමික මට්ටමේ තනතුරක් වන විදුලි කාර්මික තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 22ක් වුවද ඒ සඳහා ස්ථිර පදනමින් සේවකයින් 25 ක් බඳවා ගෙන තිබූ අතර වැඩ බැලීමේ පදනම මත ද එක් | විදුලි කාර්මික තනතුරු සඳහා අතිරික්ත සේවකයින් සිවු දෙනෙකු (වැඩ බැලීමේ පදනම මත බඳවා ගත් සේවකයෙකුද සමග ) රාජකාරියෙහි නිරතව ඇත. සේවා අවශ්‍යතාවය මත මෙම බඳවා ගැනීම සිදු කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් සේවක බඳවා ගැනීම් වලට අදාල අවශ්‍ය අනුමැතීන් විධිමත්ව ලබා ගෙන බඳවාගැනීමේ කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| සේවකයෙකු බඳවා ගෙන තිබුණි. | කෙසේ වුවද විදුලි කාර්මික තනතුරු සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කර නොමැත. | |

**5.** ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

**5.1** අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දින 1/2021 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර හා බාහිර සාධක සැලකිල්ලට ගනිමින් පුනරාවර්තන හා ප්‍රාග්ධන යන දෙඅංශයටම ආවරණය වන පරිදි යථාර්ථවාදී ලෙස ආදායම් හා වියදම් ඇතුලත් කර වාර්ෂික ගිණුම් ආකෘතියට අදාළ වන පරිදි අයවැය ගත ආදායම් හා වියදම් ප්‍රකාශයන් ශේෂ පත්‍රයක් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඇතුළත් වන පරිදි අයවැයක් පිළියෙල කර 2023 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව සමාගම විසින් අයවැය ලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා අයවැය ගත ආදායම් හා වියදම් ප්‍රකාශයක් සකස් කර තිබුණ ද එය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**5.2** තිරසාර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2030 වර්ෂය වන විට සිය සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණු අතර ඊට ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු 03ක් යටතේ ඉලක්ක 05ක් හඳුනා ගෙන තිබුණි.තිරසාර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමේදී 2023 වර්ෂය තුළ ස්ථාපිත කරන ලද ඉලක්ක 02ක ප්‍රගතිය සැලසුම් කර තිබුණු පරිදි ඉටු කරගෙන නොතිබුණි. | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන මිල්කෝ ආයතනය හා අනුබද්ධිතව ඌව, මධ්‍යම, වයඹ හා උතුරු මැද පළාත් ආවරණය වන පරිදි කිරි ගොවීන් 3,000කගේ ඵලදායීතාව සංවර්ධනය කිරීමේ වැඩසටහන2025 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, 2023 වර්ෂ අවසානය වනවිට මුළු ව්‍යාපෘතියෙන් 17%ක් ද, අඹේවෙල කර්මාන්තශාලාවේ විදුලි බලය අඛණ්ඩව සැපයීම සඳහා UPS යන්ත්‍රයක් සවි කිරීමේකටයුතු සිදුකළ යුතුව ඇත. | සැලසුම්කළ පරිදි අදාල කාර්යයන් නිම කිරීමට කටයුතු කළ යුතු වේ. |